නුඹලා මැදිහත් වී පෙනී සිටිනු. නුඹලාට ප්රතිඵල පිරිනමනු ලබනු අැත. අල්ලාහ් ඔහුගේ නබිවරයාගේ දිවෙන් තමන් කැමති දෑ තීන්දු කරනු අැත.

අබූ මූසා අල් අෂ්අරී (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. අවශ්යතාවක්
සපුරා දෙන මෙන් ඉල්ලා කෙනෙකු තම සභාගැබ ඉදිරියට පැමිණියේ නම් එවිට එතුමා “නුඹලා මැදිහත් වී පෙනී සිටිනු. නුඹලාට ප්රතිඵල පිරිනමනු ලබනු අැත. අල්ලාහ් ඔහුගේ
නබිවරයාගේ දිවෙන් තමන් කැමති දෑ තීන්දු කරනු අැත.“ තවත් වාර්තාවක (ඔහුගේ අභිමතය පරිදි) යැයි සඳහන් වී ඇත. [පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

මෙම හදීසය මූලික හා වඩාත් ප්රයෝජනවත් කරුණක් අන්තර්ගත වූවකි. එනම්, නියත වශයෙන්ම ගැත්තා යහපත් කටයුතුවලදී යුහුසුළු විය යුතුය. එහි අරමුණු හා එහි ප්රතිඵල ලැබුණ ද ඉන් කොටසක් ලැබුණ ද ඉන් කිසිවක් පූර්ණව නොලැබුණද එය එක හා සමානය. එය ප්රධානීන්, නායකින් හා අදාළ අවශ්යතාවක් සම්බන්ධයෙන් කටයුතු කරන්නන් ඉදිරියේ අවශ්යතා ඇත්තන් වෙනුවෙන් මැදිහත්ව පෙනී සිටිනවාක් මෙනි. නමුත් ජනයාගෙන් බහුතරයක් දෙනා තම මැදිහත් වීම පිළිගනුයේ කෙසේද යන්න ගැන අවබෝධයක් නොමැති නිසා එහි කැපවීමෙන් වැළකී සිටිති. ඒ හේතුවෙන් අල්ලාහ්ගෙන් ලැබෙන බොහෝ යහපත් දෑ තමන් අහිමි කර ගනු ඇත. එමෙන්ම තම සහෝදර මුස්ලිම්වරයා ඉදිරියේ තමන් හඳුන්වා දෙනු ලැබීම ද අහිමි කර ගනු ඇත. එහෙයින් නබි (සල්ලල්ලාහු අලය්හි වසල්ලම්) තුමා අල්ලාහ් ඉදිරියේ ප්රතිඵල නෙළාගනු පිණිස ඔහු ඉදිරියේ අවශ්යතා ඇත්තන් වෙනුවෙන් මැදිහත් වෙමින් ඔවුනට සහාය වීමට අණ කර ඇත්තාහ. එතුමා, “නුඹලා මැදිහත් වී පෙනී සිටිනු. නුඹලාට ප්රතිඵල පිරිනමනු ලබනු අැත.“ එහෙයින්, සැබැවින්ම යහපත සඳහා මැදිහත් වීම අල්ලාහ් සතුටට පත් කරවන්නකි. එමෙන්ම ඔහු තෘප්තියට පත් කරවන්නකි. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්රකාශ කරයි. “කවරෙකු යහපත් මැදිහත් වීමකින් කෙනෙකු වෙනුවෙන් මැදිහත් වන්නේ ද ඉන් කොටසක් ඔහුට හිමිවනු ඇත.“ (සූරා අන්-නිසා: 85) ඒ සමගම ඉදිරියේ ඇති ප්රතිඵල ඉක්මණින් ඔහුට ලැබෙනු ඇත. එමෙන්ම තම සහෝදරයා සමග යහපත් ලෙස කටයුතු කිරීමට හා උපකාර කිරීමට යුහුසුළු වනු ඇත. තම අතින්ම සිදු කර දෙනු ඇත. අතැම් විට ඔහුගේ මැදිහත් වීම හේතුවෙන් කවර කරුණක් සඳහා ඔහු මැදිහත් වන්නේද එය පූර්ණව හෝ ඉන් කොටසක් හෝ ලබන්නට හේතුවක් වෙයි. එය සිදුවක්නකි. ලැබීම හෝ නොලැබීම යන දෙකම ඇති යහපත් හා දැහැමි කටයුතුවලදී කැපවීම යනු තමන්ට ඉක්මන් යහපත ගෙන දෙන්නකි. යහපත සඳහා උපකාර කිරීමට සිත්වලට කියා පාන්නකි. සිදු වීමට අපේක්ෂා කරනු ලබන්නාවූ එමෙන්ම තහවරු කරනු ලබන්නා වූ මැදිහත් වීම් තුළින් නැගී සිටීමට මුල පුරවන්නකි. “අල්ලාහ් ඔහුගේ නබිවරයාගේ දිවෙන් තමන් කැමති දෑ තීන්දු කරනු අැත“ යන එතුමාගේ ප්රකාශය වනාහි, යම් කරුණක් සිදු වීම හෝ ලැබීම හෝ නොලැබීම හෝ සම්බන්ධයෙන් ඔහුගේ අනු දැනුමට පෙර වූ දෑ ගැන අදහස් නොකරයි. මෙය ඉල්ලා සිටිනුයේ, මැදිහත් වන්නටය. කුසල් පිහිටනුයේ එය සම්බන්ධව කටයුතු කිරීමෙනි. එය ඔහු කවර දෙයක් වෙනුවෙන් මැදිහත් වන්නේ ද එය ලැබුණත් එය ලැබීමෙන් යමෙකු වැළැක්වූවත් එක සමානය.

http://sunnah.global/hadeeth/si/show/3563